**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**

**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| **මගේ අංකය** / எனது இல. / My No. | **ඔබේ අංකය** / உமது இல. / Your No. | **දිනය** / திகதி / Date: 2023-02-08 |

පැමිණිලි පාර්ශවය : ජේ.සුමේධා ජයවීර මිය.
විදුහල්පති නිල නිවස,
ශාන්ත පාවුළු බාලිකා විද්‍යාලය,
මිලාගිරිය,
කොළඹ 04.

වගඋත්තර පාර්ශවය : එස්.එම්.බන්දුසේන මයා.
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

**<u>පැමිණිලි අංකය : HRC/4574/15</u>**

**පැමිණිල්ලේ කරුණු සැළකිරීම :-**

ඉහත පැමිණිලිකාරිය 2015-12-22 දාතමින් ඉදිරිපත් කර ඇති තම ලිඛිත පැමිණිල්ල මඟින් ප්‍රකාශ කර ඇත්තේ, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ වසර 10කට ආසන්න සේවා කාලයක් ඇති තමා කිසිදු චෝදනාවකට වැරදිකාරියක නොවී රාජකාරි ඉටු කරමින් සිටින බවත්, ඒ අනුව තමා විසින් 2013.04.26 දිනැතිව සහනදායී මෝටර් රථ බලපත්‍ර ලබා ගැනීම සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් ඉල්ලීම් ඉදිරිපත් කර ඇති නමුත්, විනය කටයුත්තක් ආරම්භ වීමට නියමිත බැවින් තමාට හිමි තීරුබදු රහිත වාහන බලපත්‍රය ලබාදීම අත්හිටුවන ලද බවත්, ඒ වන විටත් තමා වෙත කිසිදු චෝදනා පත්‍රයක් ලබා දීමක් හෝ කිසිදු විමර්ශනයක් සිදුකර නොතිබූ බවත් දක්වා ඇත. එසේ තිබියදී තමාට හිමි වාහන බලපත්‍රයේ හිමිකම වසර 2 ½ ක් පමණ ප්‍රමාද කරමින් එය ලබා නොදීම මඟින් තම මූලික අයිතිවාසිකම් කඩවී ඇති බවට පැමිණිල්ලෙන් දක්වා ඇත.




**ප්‍රධාන කාර්යාලය** / பிரதான அலுவலகம் / Head Office: **14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04.** / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
**සභාපති** / தவிசாளர் / Chairperson: 011-2505451
**ෆැක්ස්** / தொலைநகல் / Fax: 011-2505541/ 74
**ඊමේල්** / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
**දුරකථන**: 94 -11-2505580 / 81 / 82
**ලේකම්**: 011-2505521
**ක්ෂණික**: 1996
**වෙබ්** / இணையம்: www.hrcsl.lk

වගඋත්තරකාර පාර්ශවයේ කරුණු සැළ කිරීම් :-

මෙම පැමිණිල්ල මඟින් වගඋත්තරකාර පාර්ශවය ලෙස නම් කර ඇති ලේකම්, අධ්‍යාපන අමාත්‍යංශය වෙනුවෙන් සහකාර ලේකම් එම්.කේ.ටී සජීවනි මිය විසින් 2016-03-09 දාතමින් ඉදිරිපත් කර ඇති ලිඛිත කරුණු දැක්වීමෙන් ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකාරිය සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් ආරම්භව තිබූ බැවින් ඇයගේ ඉල්ලීම සලකා බැලිය නොහැකි බවත්, වෙළඳ හා ආයෝජනය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2013 සහ 01/2013 (iii) යටතේ සහනදායී මෝටර් රථ ආනයන බලපත්‍ර නිකුත් කිරීම 2015-11-20 දිනෙන් පසුව අවසන් කර ඇති බවත් ප්‍රකාශ කර ඇත.

විමර්ශනය :-

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව නීතියේ රැකවරණය සියලුම පුරවැසියන්ට සමානව හිමිවිය යුතුය යන්න අනුව 1996 අංක 21 දරණ මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 14 වගන්තිය යටතේ මෙම පැමිණිල්ලේ විෂයගත කාරණයට අදාළ විමර්ශනය සිදු කර ඇත.

ඒ අනුව අවස්ථාව කිහිපයකදී අදාළ පරීක්ෂණ සඳහා පාර්ශවකරුවන් කැඳවා විමසීම සිදු කර පැමිණිලි පාර්ශවය අපේක්ෂා කරන සහනය සලසා දී පැමිණිල්ල සමථයකට පත් කිරීමට පරීක්ෂණ නිලධාරි උත්සහ ගෙන ඇති නමුත් වගඋත්තරකරුවන් ඊට තම අනුකූලතාවය පළ කර නොමැති බවද නිරීක්ෂණය වේ.

එකී පැමිණිල්ලේ විෂයගත කාරණයට අදාළව සිදු කරන ලද වැඩිදුර විමර්ශනයේදී පාර්ශවකරුවන් ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ සහ අවසන් වශයෙන් ලබා දී ඇති නිගමනයන් අනුව 2013.03.12 දින වන විට කිසිදු විනය පරීක්ෂණයක් පැමිණිලිකාරිය විෂයයෙහි ආරම්භ කොට නොමැති බවට පැහැදිලි වී ඇති අතර, විනය පරීක්ෂණ පැවැත්වීමට අදහස් කරමින් රාජ්‍ය සේවයේ වරප්‍රසාද පැමිණිලිකාරිය විෂයෙහි අහිමි කිරීම පිළිබඳ ආයතන අධ්‍යක්ෂ වෙතින් විමසා පැහැදිලි කිරීම් ලබා ගන්නා ලෙසට යෝජනා කර ඇත.

නමුත් පැමිණිල්ලේ ප්‍රශ්නගත කාරණයට අදාළව පැමිණිලිකාරියට හිමිකමක් පවතින බවට ප්‍රකාශ කෙරෙන වාහන බලපත්‍රය, පැමිණිලිකාරිය සම්බන්ධයෙන් පැවැති විනය පරීක්ෂණ සිදුවන කාලවකවානුවේ අත්හිටුවීමට කටයුතු කළද, අදාළ විනය පරීක්ෂණයෙන් ඇයව නිදහස් කර තිබේ නම් එම ක්‍රියා පටිපාටිය ආරම්භ වූ දින සිට ඇයට හිමිවූ වරප්‍රසාද ලබා නොදීම සාධාරණ නොවන බව නිරීක්ෂණය වේ.

නිගමනය :-

ඉහත තත්ත්වය සැළකිල්ලට ගෙන පැමිණිලිකාරිය විසින් තම පැමිණිල්ල මඟින් සඳහන් කරන පරිදි 2013 වර්ෂයේ පැමිණිලිකාරියට රජයේ සේවකයෙකු ලෙස හිමිකම් ලබා නොදීම මඟින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට දී ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම්

වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝනය කරමින් සිටින බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මඟින් සහතික කොට දී ඇති පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් වගඋත්තරකාර පාර්ශවය විසින් උල්ලංඝනය කරමින් සිටින බවට අනාවරණය වීම මත ඇයට 2013 වසරවන විට හිමිකමක්ව පැවති වාහන බලපත්‍රය ලබාදීමට කටයුතු කරන ලෙස ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය හා ලේකම්, මුදල් අමාත්‍යාංශය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023. 03 - 10 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ නිමල් කරුණාසිරි
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :-

01. අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.

02. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.

03. ලේකම්,
මුදල් අමාත්‍යාංශය, කොළඹ.